## කවි කොළය



අපේ සල්ලි අපට දියව්! අපේ සල්ලි අපට දියව්!

" සාදුකින් පෙලෙන වුන් -
දැන් නැතේ අප රටේ- ඉන්නෙ
ලොක්කන් මුදල් ඇති බොහෝ
ලොකු පොලී ගන්නටා -
කෑදරේ වූ නිසා - මේ විපත්
සිදුවුණේ ඒ නිසා......
දැන් හඬා වැළපිලා-දුක කියා
පෙරලුනාත් - නෑ ඒත් එන
කෙනෙක් පිහිටටා......
පාඩමක් මේවයින්-ගත්තනම්
හොඳ තමයි - ඒ වුනත් දැන්
වැඩක් නෑ බොලේ...... //"

# මෙහෙමයි දැන් නූතන පෙළපාලි

කලාකීර්තිගෙ බලූ සක්විත්තා
දඬුවම්කාරය හොර කප්පිත්තා
පරද්දවපු කොතලාවල මුත්තා
ඉස්පිරිතාලෙට වී සැප ගත්තා

මුළු සේසත විකුණා සක් විත්තට
දුන් අය අද නැතිවී ඇත නැත්තට
රිදුමක් ඇතිමුත් ඒ ගැන ඇත්තට
බලමුද ගොස් මෙහි
නොපෙනෙන පැත්තට

පෙර කම්කරු සේවක දුප්පත්තු
වීදි සටන් කොට ජය අරගත්තු
දියව් කියා ආපසු තැන් පත්තු
පාරට බැස ඇත අද දන වත්තු

රෝහල් ලොක්කෙක් බිලියන සීයයි
තව උත්තමයෙක් ලස්ස දෙසීයයි
දේශමාන්‍ය රට වැනසී යයි
බෝඩ් ලෑලි ගෙන මහපාරේ යයි

ගහගත් තරු පටි පිත්තල බොත්තං
ගණන්කාර පෙලිසියේ මහත්තැං
කෝටුවෙ රජවරු ගිනි කන ඇත්තං
උද්ඝෝෂණයට ඇදෙති විරිත්තං

අවුරුදු ගානක් බෝලෙට ගහලා
එක්රැස් කළ සොච්චම පිරි මහලා
පොලියත් නොගෙනම ගියාලු ගහලා
අම්මප ඇඬෙනව ඒ ගැන අහලා

බිලියන ගණනින් ගහගත් පිල්ලී
වැටි බදු හොරු උපයන කළු සල්ලී
පොලිටික්කෝ සහ ඔවුනගෙ කල්ලී
හඬා වැටෙති මහ පොළවෙ ඇතිල්ලී

"නිවනට යන මග හරහට ඇවුරූ
තණ්හාවය බැඳ ඇත්තේ පවුරූ"
මේ බණ අපහට දෙසුවෝ කවුරූ
උද්ඝෝෂණයෙත් බැබළෙති සිවුරූ

තෙල් බේරෙන
ගෙඩි වැනි තක්කාලි
දනපති පන්තියෙ
සැප බඩු කෑලි
යයි පැජරෝවෙන්
ගැහෙමින් පේලි
මෙහෙමයි දැන්
නූතන පෙළපාලි

♦ තලන්ගම
ජයසිංහ
Sri Lanka





At a brief traditional ceremony on Sunday, March 22, organised by the **Api Wenuwen Api** - UK committee, **Brig. Prasad Samarasinghe** (left) handed a cheque for £6,794 to **H.E. High Commissioner Justice Nihal Jayasinghe** bringing the grand total of funds raised to over **£100,000.** Donations will be sent to the Ministry of Defence via the Sri Lankan High Commission in the UK. **( Photograph - Kasun Palamsuriya )**

## අපි වෙනුවෙන් අපි £100,000 ඉලක්කය සපුරයි

**ශ්‍රී** ලංකාවේ ආබාධිත රණවිරුවන්ට නිවාස තනාදීම සඳහා විසල් ව්‍යාපෘතියක් **අපි වෙනුවෙන් අපි වෙමු** යන තේමාව යටතේ **2008** මැයි මස **6** වෙනි දින එක්සත් රාජධානියේ ආරම්භ විණ. ලන්ඩනයේ ශ්‍රීලංකා මහා කොමසාරිස් කාර්‍යාලයේ පූර්ණ අනුග්‍රහය ඇතිව මෙම ව්‍යාපෘතිය භාරව කටයුතු කළේ මහකොමසාරිස් කාර්‍යාලයට ආරක්ෂක උපදේශකවරයා ලෙස පත්ව ආ බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ මහතාය.

විශේෂයෙන් සමරසිංහ මහතාගේත්, ව්‍යාපෘතිය වෙනුවෙන් මහන්සි නොබලා කටයුතු කළ එම කමිටුවේත්, එක්සත් රාජධානියේ වෙසෙන දේශප්‍රේමී ශ්‍රීලාංකිකයන්ගේත් කැපවීමේ මහඟු ප්‍රතිපල ලෙස අපි වෙනුවෙන් අපි ව්‍යාපෘතිය මාස **5** ක් තුළ **£94,108** ක් එකතු කර තිබිණ.

පසුගිය මාර්තු **22** වෙනි ඉරිදා අප "වෙනුවෙන් අපි එක්සත් රාජධානි ශාඛාව මගින් සංවිධානය කළ කෙටි උත්සව යකදී බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ මහතා ආධාර වශයෙන් ලද තවත් **£6,794** ක මුදලක් ශ්‍රීලංකා මහ කොමසාරිස්වර යාට බාර දුන්නේය. ඒ සමග අපි වෙනු වෙන් අපි ව්‍යාපෘතිය මේ සුළු කාලය තුළ බ්‍රිතාන්‍ය පවුම් ලක්ෂයක මුදලක් එකතු කර ඇත. ඉහතකී ඡායාරූපයේ දැක් වෙන්නේ සමරසිංහ මහතා (වමේ) එම මුදලේ චෙක්පත් මහකොමසාරිස්වර විනිසුරු නිහාල් ජයසිංහ මහතාට බාර-දෙන අන්දමයි.

මෙහිදී සමරසිංහ මහතා **අපි වෙනුවෙන් අපි වෙමු** ව්‍යාපෘතිය සාර්ථක කර ගැන්මට සහායදුන් සියළු දෙනාට, සියළු ආයතනවලට, මහකොමසාරිස්තුමාට සහ ශ්‍රීලංකා ජනාධිපතිවරයා, ආරක්ෂක ලේකම්වරයා, ත්‍රිවිධ හමුදා නායකයින්ටද ස්තුතිවන්ත වන බව පැවසීය.

# ඉගෙනුමට දක්ෂ මඩුකන්දේ දරුවෝ

**ව**වුනියාව යනු කලක් තිස්සේ පවත්නා යුද්ධය නිසා පීඩා විඳින පළාතකි. එහෙත් එහි ඇති මඩුකන්ද ශ්‍රී දළදා විහාරයේ පවත්වාගෙන යන ශ්‍රී ධම්මරතන විද්‍යායතන පිරිවෙන පිළිබඳව සතුටු වියහැකි අවස්ථාවක් මම ඔබට ලියා එවමි.

2009 වසරේ සිංහල භාෂා හා සාහිත්‍ය තරඟ 2009/03/07/14/21 දිනවල සමස්ත ලංකා මට්ටමින් කොළඹ ආනන්ද විද්‍යාලයේ දී පැවැත්විය. එම තරඟවලට සහභාගි වූ මෙම ශ්‍රී ධම්ම රතන විද්‍යායතන පිරිවෙන් දරුවන් සියළු දෙනාටම විශේෂ ස්ථාන ලැබී ඇත.

ඉෂාර ලක්මාල්, නිමාලී නදීෂිකා, මේනකා උදයාංගනී, දේශානී නිලංකා, සසින්තා ප්‍රියරාණී, දේශානී නිලංකා, සහ සුමිත් ප්‍රසන්න ඒ දරුවෝ වෙති. කථිකත්වය ගායනා සහ කියවීම යන අංශ වලින් මේ දරුවන් දෙවන පස්වන ආදී වශයෙන් ස්ථාන හිමිකර ගැන්ම ඉතා දුෂ්කර පෙදෙසක වාසය කරන ජන තාවක් ලෙස ප්‍රශංසනීය නොවන්නේද?

මෙවන් දක්ෂ දරුවන් සිටින දුෂ්කරතා ඇති අධ්‍යාපන ආයතන කෙරෙහි රට දැය සමයට ආදරය කරන ශ්‍රීලංකාව තුළ වෙසෙන සැම දෙනාගේ සහ විදේශයේ වෙසෙන අප දේශප්‍රේමී ශ්‍රී ලාංකික ජනතාවගේත් අවධානය යොමු වේවා යි මම ප්‍රාර්ථනා කරමි.

ශාස්ත්‍රපති කුරුඳුගොඩ
පඤ්ඤාසාර හිමි
ශ්‍රී ධම්මරතන විද්‍යායතන පිරිවෙණ
මඩුකන්ද වව්නියාව





**ඉරිදා** - කොටි ත්‍රස්තවාදියො කාලෙකට ඉස්සර විනාස
**SUN** කරපු උතුරට යන යාලදේවි කෝච්චිය රෙපයාර් කරලා, කැඩුම් බිඳුම් හදල ආයිත් රේල් පාරට දාන්න රජය ලෑස්තිවෙන බව පත්තර වල තිබුණා. ඒ වැඩේට උදව් කරන්නය කියලා ජනාධිපතිතුමා රටේ ජනතාවට කියනවා. එතුමා තමන්ගෙ මාස කීපයක පඩියත් ඒ වැඩේට පරිත්‍යාග කළ බව කියවෙනවා. මම හිතන්නෙ සිංහළ මිනිස්සුන්ට වැඩිය කොළඹ ඉන්න දෙමළ ජනතාවටයි, දෙමළ බිස්නස්කාරයින්ටයි කියන්න ඕන උඹලයි ඕකෙන් වැඩිය ප්‍රයෝජනේ ගන්නෙ... උඹලා සල්ලි දාපල්ලා කියලා.. ඕක හැදුවම දවසට දෙතුන් පාර යාපනේට දුවන්නෙ උඹලා. සිංහළ මිනිස්සු යන යාපන යක් නෑ.... ඒ හන්දා උඹලා හංගන් තියන සල්ලි යාල දේවි වැඩේට එකට දාපල්ල කියලා.

**සඳුදා** - එක අතකට හිනා යනවා, අනික් පාර හිනා
**MON** වෙන්නෙ මොකටද හිතෙනවා. ඒ තරම් දේවල් මේ එංගලන්තෙ ඇතුළෙ අපේ ලංකාව ගැන කතාවෙනවා. ලන්ඩන්වල ඉන්න කොටියන්ගෙ ඡන්ද බලාපොරොත්තුවෙන් වැඩ කරන ලේබර් පක්ෂයෙ මන්ත්‍රී කෙනෙක් කියලා තිබුණා, ලංකාව පොදුරාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වයෙන් පන්නලා දානව කියලා. මට මතක්වෙනවා අවුරුදු ගණනකට ඉස්සර පීජී දූපතේ බලය අයිතිකර ගත් අගමැති සිටිවෙනි රබූකා බ්‍රිතාන්‍යයෙන් කැඩුණු වෙලාවෙ බ්‍රිතාන්‍ය රජය කිව්වම අපි පොදුරාජ්‍ය මණ්ඩලයෙන් පීජී පන්නනව කියලා ඒකට රබූකා දුන්න උත්තරේ තමයි "අනේ පන්නපල්ලා අපිට කොහොමත් ඔය කෙහෙල්මලේ ඉන්න ඕනකමක් නෑ" කියලා. ලංකාවට කියන්න තියෙන්නෙත් අන්න ඒ ටිකම තමයි.

**කුජදා** - එංගලන්තෙ ඉන්න දෙමළ කොටි සාමාජිකයො
**TUE** ලංකාවෙ උතුරෙ ඉන්න ඒ අයගෙ අනාථ නෑයින්ට යවන්න කියලා බඩු එකතුකරනවා. හාල් තුනපහ ඇඳුම් සල්ලි නැවක පටවලා යවනවලු. සල්ලි නැවේ දාලා යවන්නෙ නැතිලු ඒවා නැතිවේය කියන බයට. ඒවා ඒ එකතුකරන අය ළඟම පරිස්සමට තියාගන්නවලු, පස්සෙ ප්‍රභාකරන්ට සතේට ගණන් බේරනවලු. හොරයක් බොරුවක් නැති හරි අවංක කස්ටිය. ඒ ආධාර එකතු කරන්නෙ අඩ අඩා. උතුරෙ ඉන්න අය මතක්වෙන කොට පපුව වාවන්නෙ නැතෙයි කියනවා. සාමාන්‍යයෙන් සුද්දො අඩන්නෙ නෑ නේ. ඒ වුනාට කොටින්ගෙ ඇඩිල්ලට සයිමන් හියුස් වගේ සුද්දොත් අඩ අඩ පාර්ලිමේන්තුවෙ කතාකරලා තියනවා. දැන් කවුරුත් බලන් ඉන්නෙ නැව ගියොත් ලංකාවට ඊළඟට මොකද වෙන්නෙ කියලා. අපේ නාවික හමුදාව නැව මූදෙම ගිල්ලවාවිද?

**බුදදා-** ලංකාවෙ සිංහළ ටෙලි නාට්‍යවල ඇඳුම් ගැන මටත්
**WED** කල්පනා වුණේ රෝහිණී ඒ බව කිව්වමයි. සිංහළ ඇඳුමක් කියලා දෙයක් ඒවයෙ දකින්න ඇත්තෙම නෑ. ගෙදර පුතා, දුව, අම්මා සේරම අඳින්නෙ ඩෙනිම් ජීන්ස් සහ ටී ෂර්ට්. තාත්තා හැම තිස්සෙම ඉන්නෙ ත්‍රී පීස් සූට් ගහලා. තාත්තා හම්බ වෙන්න එන තාත්තගෙ වයසෙ යාළුවොත් සූට් ගහලා ඉන්නෙ. අපි හොඳාකාර දන්නවා ලංකාවෙ තියෙන පිච්චෙන රස්නෙට සූට් ගහන් ඉන්න තියා බැනියමක් ඇඳන් ඉන්න බැරි බව. ඒ ටෙලි නාට්‍යවල කතා බහත් බාගයක් සිංහළ බාගයක් ඉංග්‍රීසි. ගෙදර වැඩට ඉන්න කොළුවයි කුස්සි අම්මයි විතරයි සරමක් කමීසයක් රෙද්දක් හැට්ටයක් ඇඳලා ඉන්නවා දකින්නෙ. උන් විතරයි අඩු ගණනෙ සිංහළ කතාකරන්නෙ. ලංකාවෙ තුප්පහි සංස්කෘතිය වගාකරන්නෙ ඒ ටෙලි නාට්‍යය.

**ගුරුදා -** ත්‍රස්තවාදෙ නිසා ලංකාවෙ කඩං වැටිච්ච ආර්-
**THU** ථිකේ ගොඩ නග්ගන්න අපේ රජයයි, සංචාරක දෙපාර්තමේන්තුවයි මහන්සි ගන්නවා කියලා එක පැත්තකින් කියනවා. කටුනායක අපේ ගුවන් තොටුපළේ විවේකාගාරය දිහා බැලුවම සංසාරෙ එපා වෙනවා. තේ කෝපි ඉහිරිලා, සිගරට් කොට හැම තැනම, මාස ගණනකින් අතුගාලා පිරිසිදු කරලා නෑ. හරක් මඩුවක් වගේ. ඔය විදියට සංචාරකයො ඒ විද? සංචාරක ඇමති කෙනෙක් ලංකාවට ඉන්නවද කියලත් සැකයි.

**කිව්දා-** පෙරේදා අප්‍රේල් පළවෙනිදා. මට මතක නැතිවුණා
**FRI** මෝඩයගෙ දවස කියලා. උදේ ප්‍රංශයෙන් කෝල් එකක් ආවා ගුණරත්න අයියගෙන් ප්‍රභාකරන් පොළගෙක් කාලා මැරිලයි කියලා. මම ඇහුවා මැරුණෙ පොළඟද කියලා. තව විනාඩි විස්සකින් ලංකාවෙන් තව **text** පණිවිඩයක් එනවා පොට්ටු අම්මාන් ගෑණු හූට පටේ කට ප්‍රභාකරන්ට වෙඩිතිච්චයි කියලා. ඔය විදියට ප්‍රභාකරන් මැරිච්ච විධි සිය ගණනක් ගැන ආරංචි වුණා. ඒවා අහල ප්‍රභාකරන් කිව්වලු මගේ උපන්දිනේටවත් මෙච්චර සුබපැතුම් ආවෙ නෑ කියලා.

**ශනිදා-** සිංහළ අවුරුද්දට ලංකාවට ඇවිත් යන්න කියලා
**SAT** තලවකැලේ නැන්දම්මා ගිය සුමානෙ ටෙලිපෝන් කරපු වෙලාවෙ කිව්වා. මම කිව්වා පුතාගෙයි දුවගෙයි විභාගෙ ළඟදි තියනවා ඒ නිසා අමාරුය කියලා. නැන්දම්මා මතක් කරලා දුන්නා මම ගිය අවුරුද්දෙත් එහෙම කියපු බව. එක අතකට අපි අවාසනාවන්තයි.